ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුව

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 308 - තැපැල් දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 23 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, දෙපාර්තමේන්තුවේ 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන් 1 කෙරෙහි අවධානය යොමු කරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150හා 151සහ 2025 පෙබරවාරි 21දින සංසෝධිත 2024දෙසැම්බර් 16දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 2024/06 අනුව තැපැල් දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශතාවය සඳහා සකස් කර ඇත .එම නිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක . මගේ වාර්තාව තැපැල් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණු කර ඇත .මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 පෙබරවාරි 21 දින සංශෝධිත 2024 දෙසැම්බර් 16 දිනති රාජ්‍යය ගිණුම් මාර්ගෝපදේශ අංක 06/2024 අනුකූලව සියලූම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරිම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශිලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරිම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) ආදායම් ලැබීම්

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	දෙපාර්තමේන්තුව විසින් විදේශ තැපැල් පරිපාලන ආයතන වෙත ගිණුම් සකස් කර ඉදිරිපත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානයට එම තැපැල් පරිපාලන ආයතන විසින් අනුමත කර නොමැති හිඟ ආදායම් ශේෂය රු.355,410,140 ක් වූ අතර එය වර්ෂ 01 සිට වර්ෂ 08 ක් දක්වා කාල පරාසයක විහිදී තිබුණි.	විදේශ තැපැල් පරිපාලන ආයතන අදාළ ආදායම් අනුමත කිරීම ප්‍රමාද වීමට හේතු සොයාබැලිය යුතුය.	අනුමත නොකළ හිඟ ආදායමෙන් 2025 අප්‍රේල් 30 දින වන විට රු.216,938,844 ක මුදලක් අනුමත වී ඇති අතර රු.138,471,295 ක මුදලක් තවදුරටත් අනුමත වීමට ඇත. හිඟ ආදායම් අනුමත නොවූ රටවල් වෙත නිරතුරු සිහිකැඳවීම් යොමු කරමින් සහ ඒ පිළිබඳව සොයා බලමින් එම හිඟ ආදායම් අනුමත කර ගැනීමට කටයුතු කරන බව.
ii.	ඒසීඒ-1 ආදායම් ප්‍රකාශයේ මුදලින් ආපසු ගෙවීම් රු.11,861,687 ක් හා වැරදි නිවැරදි කිරීම් රු.13,785,759 ක් ලෙස ආපසු ගෙවීම් එකතුව රු.25,647,446 ක් දක්වා ඇති අතර එයින් අනුමැතිය ලැබී ඇති මුදලින් ආපසු ගෙවීම් රු.1,140,173 ක් හා වැරදි නිවැරදිකිරීම් රු.4,393,293 ක් වූ අතර එහි මුළු වටිනාකම රු.5,533,466 ක් විය. ඒ අනුව රු.20,113,980 ක් ආපසු ගෙවීම් සඳහා අනුමැතිය ලබාදී නොතිබුණි.	ආදායමින් ආපසු ගෙවීම් සහ වැරදි නිවැරදි කිරීම සඳහා අනුමැතිය ලබාගත යුතුය.	ඉදිරියේදී පොදු 29 ආකෘතිය මගින් අනුමැතිය ලබාගැනීමෙන් පසුව ගෙවීම් කිරීමට නිලධාරීන් දැනුවත් කළ බව.

(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට කේවළ ණය ශේෂය රු.111,787,510 ක් වූ අතර එදිනට පාලන ගිණුමේ ශේෂය රු.115,008,249 ක් විය. එම ණය ශේෂ සැසඳීම් සඳහා පිළියෙළ කළ ප්‍රකාශයේ ණය ශේෂ හඳුනා ගැනීමට කටයුතු නොකර හඳුනාගත නොහැකි වූ කේවල ණය ශේෂය ලෙස රු.2,483,221 ක් දක්වා තිබුණි. ඒ අනුව අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයේ රු.2,483,221 ක නොසැසඳුනු ශේෂයක් පැවතුණි.	කේවල ණය ශේෂය හා පාලන ගිණුමේ ශේෂය සැසඳිය යුතුය.	අනුරාධපුර දිසා ගිණුම් කාර්යාලයේ පවතින රු.2,483,221 ක නොසැසඳුණු ශේෂය සම්බන්ධයෙන් ගිණුම් නැවත පරීක්ෂා කිරීම් සිදු කෙරෙමින් පවතින බවත් කඩිනමින් එම දෝෂ නිරවුල් කිරීමට කටයුතු කරන බව.

ii.	කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ ගණනාවක සිට රු.749,440 ක ගිණුම්කරණ දෝෂයක් පැවතුණු අතර එය 2024 දෙසැම්බර් 31 දින වන විටත් හඳුනාගෙන ගිණුම්වල නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි.	ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කළ යුතුය.	ගිණුම්කරණ දෝෂය නිරවුල් කරගැනීම සම්බන්ධයෙන් උපදෙස් ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කරගෙන යමින් පවතින බව.
iii.	කළුතර දිසා ගිණුම් කාර්යාලයේ වර්ෂ 11 කට පෙර රු.1,295,400 ක වටිනාකමැති මුද්‍රා වංචාවක් අනාවරණය වී තිබුණු අතර 2024 දෙසැම්බර් 31 දින වන විටත් එයින් රු.1,145,850 ක ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. මේ පිළිබඳ ඉකුත් වර්ෂවල විගණන වාර්තාවලින් පෙන්වා දුන්නද ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.	වගකිව යුතු පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය.	මෙම ණය ශේෂය දෙපාර්තමේන්තුවේ ණය කපා හැරීමේ කමිටුව වෙත ඉදිරිපත් කිරීමට නියමිත බව.
iv.	සමාලෝචිත වර්ෂය අවසානයට මියගිය, විශ්‍රාම ගිය, වැඩ තහනම් කළ, සේවය හැරගිය හා වෙනත් නිලධාරීන්ගෙන් අයවිය යුතු ණය ශේෂය රු. 61,225,431 ක් වූ අතර එයින් වර්ෂ 05 කට වැඩි කාලයක සිට පැවත එන ණය ශේෂය රු.20,679,788 ක් විය.	හිඟ ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුය.	හිඟ ණය ශේෂයන් අයකර ගැනීම සඳහා කටයුතු කරමින් පවතින බව.

(ඇ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	නිරික්ෂණය වටිනාකම රු.	අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය				
i.	VIII පරිච්ඡේදයේ 2.1, 3.1, 3.3, 3.5, 3.6 වගන්ති සහ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	7,024,144	ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර තිබුණද ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සලකා බැලීමකින් තොරව පස්වරු 16.15 ට තැපැල් මූලස්ථානයෙන් පිටත්වන සේවකයින් රාත්‍රී 7, 8, 9,	ආයතන සංග්‍රහයේ අදාළ විධිවිධාන පරිදි හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.	දෙපාර්තමේන්තුවේ පවතින 1651 ක් වන තැපැල් සේවක නිලධාරී පුරප්පාඩු නිසා අත්‍යාවශ්‍ය හා ඉතා හදිසි කාර්යයන් මේ

			10 යන වේලාවල්වල රාජකාරී සිදු කළ බව දක්වා රු.7,024,144 ක අතිකාල දෙපාර්තමේන්තුව විසින් ගෙවා තිබුණි. මේ හේතුවෙන් ගෙවා තිබුණු අතිකාල දීමනා ගෙවීම්වල නිවැරදිතාවය විගණනයට පරීක්ෂා කළ නොහැකි විය.		වන විට අතිකාල මත කිරීමට සිදුව ඇති බව.
ii.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 2.1, 3.1, 3.3, 3.5, 3.6 වගන්ති සහ 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	1,030,910,731	ඇඟිලි සළකුණු යන්ත්‍රයක් සවිකර නොතිබියදී මධ්‍යම තැපැල් හුවමාරුවේ 2023 ජනවාරි සිට 2024 මැයි 31 දින දක්වා සේවකයන් 28,403කට රු.651,149,689 ක්ද, පාලක විමර්ශන කාර්යාලයේ 2020 ජනවාරි 01 දින සිට 2024 මැයි 31 දින දක්වා සේවකයින් 07 කට රු.4,067,021 ක්ද, ඇඟිලි සළකුණු යන්ත්‍රයේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සලකා බැලීමකින් තොරව දිසා ගිණුම් කාර්යාල 14 විසින් 2024 ජනවාරි සිට ජුනි දක්වා රු.373,874,705 ක්ද, තැපැල් ප්‍රවාහන අංශයේ 2024 ජනවාරි සිට මැයි දක්වා සේවකයින් 15 කට රු.1,819,316 ක්ද වශයෙන් එකතුව රු.1,030,910,731 ක මුදලක් අතිකාල දීමනා වශයෙන් ගෙවා තිබුණි.	ආයතන සංග්‍රහයේ අදාළ විධිවිධාන පරිදි හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම රාජ්‍ය ආයතනවල ඇඟිලි සළකුණු සටහන් කිරීමේ යන්ත්‍ර භාවිතය මගින් නිලධාරීන් කාර්යාලයට පැමිණීම හා පිටවීම සනාථ කිරීම සම්බන්ධයෙන් වාර්තා තබාගත යුතු අතර වේලාව පදනම් කර ගනිමින් අතිකාල හා නිවාඩු දින වැටුප් ආදී නිත්‍ය රාජකාරී වේලාවෙන් පසුව ගෙවනු ලබන දීමනා සඳහා කාලය පදනම් කර ගන්නේ නම් එම කාලය ඇඟිලි සළකුණු යන්ත්‍ර මගින් සනාථ කළ යුතුය.	දෙපාර්තමේන්තුවේ පවතින 1651 ක් වන තැපැල් සේවක නිලධාරී පුරප්පාඩු නිසා අත්‍යාවශ්‍ය හා ඉතා හදිසි කාර්යයන් මේ වන විට අතිකාල මත කිරීමට සිදුව ඇති බව.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
මු.රෙ. 85(1) සහ මු.රෙ.85(2) විධිවිධාන අනුව ආදායම් ඇස්තමේන්තු සහ සංශෝධිත ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතු වුවත් දෙපාර්තමේන්තුවේ ආදායම් කාණ්ඩ 21 ක අහිතකර විචලතාව රු.666,310 සිට රු.473,524,039 ක් දක්වා වූ පරාසයක පැවති අතර ආදායම් කාණ්ඩ 16 ක හිතකර විචලතාවය රු.1,610,499 සිට රු.1,090,364,358 ක් දක්වා පරාසයක පැවතුණි.	ආදායම් ඇස්තමේන්තු තාත්වික හා නිවැරදි ආකාරයට සකස් කළ යුතුය.	ජනාධිපතිවරණය හා පාර්ලිමේන්තු මහ මැතිවරණය සඳහා වූ තැපැල් සේවා ගාස්තු ආදායම ගිණුම්ගත කිරීම, නව නියෝජිත සේවාව 2024 වර්ෂයේ මැද භාගයේදී ආරම්භ වීම, අලෙවිකරණ අංශය යටතේ මෙහෙයවන ලද ප්‍රවර්ධන කටයුතු හේතුවෙන් ආදායම වැඩිවීම යනාදී කරුණු ඇස්තමේන්තුව සකස් කරන අවස්ථාවේ එයට ඇතුළත් නොකිරීම හේතු වූ බව හා පාරිභෝගිකයන් විද්‍යුත් තැපැල් වැනි විකල්ප ක්‍රමවලට හුරුවීම, ව්‍යාපාරික ආයතන e bill සැපයීම, විදේශ විනිමය අනුපාතවල විචලනයන්, විදුලි බිල්පත් ගාස්තු අඩුවීම, මාර්ගගත ක්‍රමවලට යොමුවීම වැනි හේතු නිසා ඇස්තමේන්තු කළ ආදායම අඩුවීමට බලපා ඇති බව.

2.2 වියදම් කළමනාකරණය.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	මු.රෙ. 66 යටතේ ප්‍රතිපාදන මාරු කිරීම් කරන ලද වැය විෂයයන් 04 ක රු.163,508,097 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. තවද මේ තුළ ඇතුළත් 1003 වැය විෂය සඳහා පරිපූරක ඇස්තමේන්තුව හරහාද ප්‍රතිපාදන ලබාගෙන තිබුණි.	වැය විෂයයන්වලට අදාළ වියදම් නිවැරදිව ඇස්තමේන්තුගත කර ප්‍රතිපාදන ලබාගත යුතුය.	2024 දෙසැම්බර් 31 දින වන විට අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවීම මත හා දුම්රිය දෙපාර්තමේන්තුව අපේක්ෂිත පරිදි වියදම් ගිණුම්ගත නොකිරීම මත ඉතිරිවීම් සිදුවී ඇති බව.
ii.	අධි ප්‍රතිපාදන ලබාගැනීම හේතුවෙන් පුනරාවර්තන වැය විෂයයන් 15 ක හා මූලධන වැය විෂයයන් 08 ක එකතුව රු .2,430,343,189 ක් ඉතිරි වී තිබුණු අතර එය සියයට 10 සිට සියයට 99ක පරාසයක් දක්වා විහිදී තිබුණි.	වැය විෂයයන්වලට අදාළ වාර්ෂික වියදම් නිවැරදිව ඇස්තමේන්තුගත කර ප්‍රතිපාදන ලබාගත යුතුය.	2024 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත පරිදි වියදම් සිදු නොවූ බැවින් ප්‍රතිපාදන ඉතිරි වී ඇති බව.

2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	2022 වර්ෂයේදී හඳුනාගත් රු.1,459,584 ක නොපියවූ බැදීම් බැරකම් වටිනාකමක් 2024 දෙසැම්බර් 31 දිනට පැවතුණි. තවද මෙම වටිනාකම්වලින් අයිතම 09 ක වටිනාකම රු.1,024,884 ක් සිගාස් වැඩසටහන තුළ පැවතුණද අවසන් ගිණුම තුළින් ඉවත් කර තිබුණි.	සියලු බැරකම් නියමිත පරිදි පියවීමට කටයුතු කළ යුතුය.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව.
ii.	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06 වන ඡේදය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදී භාවිතා කළ යුතු ආකෘතිවල දක්වා ඇති ඇමුණුම (III) ප්‍රකාරව සහ 2024 නොවැම්බර් 20 දිනැති අංක 05/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛයේ 4.8 වගන්තිය ප්‍රකාරව නව සිගාස් වෙබ් පිටුවෙන් උඩුගත කරන ලද බැදීම් හා බැරකම් ඇතුළත් කළ යුතු ලෙස දක්වා තිබුණද මු.රෙ. 94(2)(3) යටතේ දක්වා ඇති රු.500,312,809 ක් සම්බන්ධයෙන් එසේ කටයුතු කර නොතිබුණි.	2024 දෙසැම්බර් 16 දිනැති අංක 06/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 06 වන ඡේදය, 2024 නොවැම්බර් 20 දිනැති අංක 05/2024 දරන රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 4.8 වගන්තිය ප්‍රකාරව නව සිගාස් වෙබ් පිටුවෙන් උඩුගත කරන ලද බැදීම් හා බැරකම් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය.	රු. 500,312,809 ක මුදල 2024 වර්ෂයට අදාළ ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් සිගාස් පද්ධතියට බැදීම් හා බැරකම් ලෙස ඇතුළත් කිරීමට හැකියාවක් නොවූ බව.
iii.	සිගාස් වැඩසටහනට ඇතුළත් කළ රු.434,700 ක බැරකම් රජයේ මුද්‍රණාලයට ගෙවිය යුතු වන අතර එවා සිගාස් වැඩසටහනේ ද්විගණනය වී ඇත. තවද සිගාස් වැඩසටහනේ එම බැරකම් 2022 / 2023 වසරවල සිට පවතින අගයන් වන අතර එම වටිනාකම් 2024 වර්ෂයේ ඇතිවූ බැදීම් ලෙසද හඳුනාගෙන තිබුණි.	සියලු බැදීම් මූල්‍ය ප්‍රකාශයන්හි බැදීම් හා බැරකම් ප්‍රකාශය යටතේ නිවැරදිව හඳුනාගත යුතුය.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව.
iv.	සිගාස් වැඩසටහනට හඳුනාගෙන තිබුණු රු.30,610,050 ක බැරකම් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනයන්හි බැදීම් බැරකම් ප්‍රකාශය යටතේ හඳුනාගෙන නොතිබුණි.	සියලු බැදීම් හා බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගත යුතුය.	ඉදිරියේදී මෙවැනි දෝෂ සිදු නොවන පරිදි කටයුතු කිරීමට අදාළ නිලධාරීන් දැනුවත් කර ඇති බව.

v.	2024 වර්ෂයට අදාළව රු.1,254,870 ක වටිනාකමැති බැරකම් සඳහා 2025 වසරේ වියදම දරා ඇති නමුත් ඒවා බැරකම් ලෙස ගිණුමට හඳුනාගෙන නොතිබුණි.	බැඳීම් හා බැරකම් නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට හඳුනාගත යුතුය.	ඉදිරියේදී එසේ නොවීමට කටයුතු කරන බව.
vi.	මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැඳීම් හා බැරකම් සඳහා එළඹිය යුතු වුවද දෙපාර්තමේන්තුව විසින් වැය විෂයයන් 06 ක ප්‍රතිපාදන ඉක්මවා රු.21,665,612 ක බැඳීම් හා බැරකම්වලට එළැඹී තිබුණි.	මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැඳීම් හා බැරකම් සඳහා නොඑළඹිය යුතුය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 තුළින් ලබාදී ඇති මගපෙන්වීම් අනුව නිවැරදිව බැඳීම් හා බැරකම්වලට එළඹීමට කටයුතු කරන බව.
vii.	අංක 01/2024 දරන අයවැය චක්‍රලේඛයේ 2.2.1 අනුව වැටුප්, දීමනා හා ගමන් වියදම් යටතේ අංක 1002 දරන වැය විෂය මගින් අතිකාල දීමනා සඳහා වෙන්කර ඇති ප්‍රතිපාදන සීමාව තුළ පමණක් වියදම් දැරීම සඳහා බැඳීම් ඇතිකර ගත යුතු බව දක්වා තිබුණද, 2024 වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිවීම් රු.1,641,680 ක් වුවද බැඳීම් හා බැරකම් වටිනාකම රු.6,574,295 කි. ඒ අනුව ප්‍රතිපාදන ඉක්මවා තිබූ වටිනාකම රු.4,932,615 ක් විය.	අංක 01/2024 දරන අයවැය චක්‍රලේඛයේ 2.2.1 අනුව කටයුතු කළ යුතුය.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 තුළින් ලබාදී ඇති මගපෙන්වීම් අනුව නිවැරදිව බැඳීම් හා බැරකම්වලට එළඹීමට කටයුතු කරන බව.
viii.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 (12) අනුව සියලු බැඳීම් හා බැරකම් නිසිපරිදි ඒකාබද්ධ කර භාණ්ඩාගාර තොරතුරු පද්ධතිය හා නව සිගාස් ගිණුම් තොරතුරු පද්ධතිය හරහා භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතු ලෙස දක්වා ඇති නමුත් ඇමුණුම IV යටතේ දක්වා ඇති රු.500,312,809 ක බැරකම් හඳුනාගෙන නොතිබුණි.	ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 (12) ප්‍රකාරව සියලු බැඳීම් හා බැරකම් නව සිගාස් ගිණුම් තොරතුරු පද්ධතිය හරහා භාණ්ඩාගාරය වෙත වාර්තා කළ යුතුය.	ඉදිරියේදී ජාතික අයවැය චක්‍රලේඛ අංක 01/2024 තුළින් ලබාදී ඇති මගපෙන්වීම් අනුව නිවැරදිව බැඳීම් හා බැරකම්වලට එළඹීමට කටයුතු කරන බව.

2.4 තැන්පතු

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	සමාලෝචිත වර්ෂය අවසානයට තෙවන පාර්ශවය වෙනුවෙන් නැවත ගෙවීම සඳහා රඳවාගන්නා (13/39) තැන්පත් මුදල රු.6,260,888 ක් වූ අතර ඉන් රු.390,616 ක මුදලක් වර්ෂ 02 ඉක්මවූ තැන්පත් මුදල් වන අතර ඒ සම්බන්ධව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	මු.රෙ. 571 ප්‍රකාරව වර්ෂ 02 ඉක්ම වූ තැන්පත් රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	2025 වර්ෂයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව.

ii.	2021 වර්ෂයට අදාළව සිදුකරනු ලැබූ ප්‍රසම්පාදන කාර්යයන් 03 කට අදාළව ලබාගෙන තිබුණු රු.4,331,100ක් වටිනාකමැති කාර්යසාධන බැඳුම්කර පවරාගෙන රාජ්‍ය ආදායමට බැර නොකර 2024 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි.	ප්‍රසම්පාදන කාර්යයන් අවසන් වී ඇති හා අදාළ ආයතන ඉල්ලීම් ලිපි ඉදිරිපත් නොකරන්නේ නම් රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු කළ යුතුය.	2025 වර්ෂයේදී රජයේ ආදායමට බැර කිරීමට කටයුතු කර ඇති බව.

2.5 බැංකු ගිණුම් මෙහෙයවීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
දිසා ගිණුම් කාර්යාල 14 ක, මධ්‍යම තැපැල් හුවමාරුව, මුද්දර කාර්යාංශය සහ ප්‍රධාන කාර්යාලයේ බැංකු ගිණුම් 30 ක ගෙවීමට ඉදිරිපත් නොකළ මාස 06 කට වැඩි චෙක්පත් රු.14,436,227 ක්ද, හඳුනා නොගත් ගෙවීම් රු.61,199,823 ක්ද සහ හඳුනා නොගත් ලැබීම් රු.275,924,776 ක්ද විය.	ගෙවීමට ඉදිරිපත් නොකළ චෙක්පත් සම්බන්ධයෙන් මු.රෙ. 396 (ඇ) ප්‍රකාරව, එනම් චෙක්පත නිකුත් කළ දිනය, එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් එය මුදල් නොකර තිබුණුහොත් සහ ලියුම්වලට පිළිතුරක් එවා නැත්නම්ද එම චෙක්පත් අවලංගු කර චෙක්පත්වල වටිනාකම ගෙවීමට ඇති ණයක් වශයෙන් නියමිත ලෙජර්වල සටහන් කළ යුතුය.	පරීක්ෂා කර නොපමාව වාර්තාවක් ඉදිරිපත් කරන බව.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 සැලැසුම් කිරිම

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගති වාර්තාව අනුව ව්‍යාපෘති 10 කට අදාළව වෙන්කර තිබුණු ප්‍රතිපාදන ඉක්මවා තිබුණි.	ප්‍රතිපාදන නිවැරදිව ඇස්තමේන්තු කළ යුතු අතර ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව තුළ වියදම් දැරිය යුතුය.	2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් කර ඇති ව්‍යාපෘති 10 සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වියදම් කිරීම සම්බන්ධයෙන් අදාළ පළාත්බද නියෝජ්‍ය තැපැල්පතිවරුන්ගෙන් විමසා ලිපි ඉදිරිපත් කර ඇති බව.
ii.	දෙපාර්තමේන්තුවේ 2024 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය පිළිබඳ වාර්තාවට අනුව වර්ෂය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ	සැලසුම් කළ කාර්යයන් නියමිත කාලය තුළ නිම කළ යුතුය.	ප්‍රමාණවත් පිළිතුරක් ලබාදී නොමැත.

මුළු ව්‍යාපෘති සංඛ්‍යාව 216 ක් වූ අතර ඉන් ව්‍යාපෘති 133 ක් පමණක් අවසන්කර තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේදී Miniature Sheets of Sri Lanka ප්‍රකාශනය එක් පිටපතක් රු. 4,860 බැගින් පිටපත් 500 ක් රු. 2,430,000 කට මුද්‍රණය කර තිබුණු අතර එක් ප්‍රකාශනයක් නිර්මාණය කිරීම සඳහා භාවිතා කර ඇති සිහිවටන පත්‍රිකා සංඛ්‍යාව 118 ක් වූ බැවින් ප්‍රකාශන 500 ක් සඳහා භාවිතා කර ඇති සිහිවටන ප්‍රමාණය 59,000 ක් විය. එක් ප්‍රකාශනයක ඇති සිහිවටන පත්‍රිකාවල වටිනාකම රු. 8,244 ක් වූ අතර සිහිවටන පත්‍රිකාවල මුළු වියදම රු. 4,122,125 ක් විය. මෙම වියදම්වලට අමතරව සිහිවටන පත්‍රිකා රඳවන මිලදී ගැනීම සඳහා යූරෝ 6,415 ක්ද වියදම් කර තිබුණි. කෙසේ වුවත් 2024 මාර්තු 13 දින විගණනය විසින් සිදුකරන ලද පරීක්ෂාවේදී රු. 6,552,125 ක් සහ යූරෝ 6,415 ක් වැය කර මුද්‍රණය කළ කිසිඳු ප්‍රකාශනයක් අලෙවි කර නොතිබුණු බව නිරීක්ෂණය විය. එම ප්‍රකාශන සීල් කර අල්මාරියක ගබඩා කර තිබුණු අතර ඒ පිළිබඳව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් ඉදිරිපත් කළ වාර්තාවට අනුව එම අල්මාරිය තුළ ප්‍රකාශන 482 ක් තිබුණු බවත් ඒ අනුව ප්‍රකාශන 18 ක ඌනතාවයක් පවතින බවත් නිරීක්ෂණය විය.	මුදල් රෙගුලාසි ප්‍රකාරව වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන ඒ අනුව නිසි ක්‍රියාමාර්ග ගත යුතුය.	අල්ලස් හා දූෂණ කොමිෂන් සභාවේ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව.

3.3 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	ගොඩනැගිලි හා ඉදිකිරීම් (308-02-01-2104) වැය විෂයය යටතේ පොළොන්නරුව තැපැල් කාර්යාලය සඳහා තනිමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් රු.62,900,000 ක වියදමක් දරා ඇතත් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ මෙම වත්කම් අයිතමය ඇතුළත් කර නොතිබුණි.	2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයට මෙම වත්කම් අයිතමයේ වටිනාකම ඇතුළත් කළ යුතුය.	පොළොන්නරුව තැපැල් කාර්යාලය සඳහා රු. 62,900,000 ක වියදමක් දරා ඉදි කරන ලද තනි මහල් ගොඩනැගිල්ල සිගාස් වැඩ සටහනට ඇතුලත් කිරීම සඳහා යොමු කර ඇති බව.

ii.	සමාලෝචිත වර්ෂයේ මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාවේ(SA-82) 2024 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වටිනාකම ලෙස රු.2,395,758,600 ක් දක්වා තිබුණ ද ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව මෝදර තැපැල් කාර්යාල ගොඩනැගිලි වටිනාකම රු.2,200,000 ක් දෙවරක් ගණනය කර තිබීම නිසා එම වටිනාකම රු. 2,200,000 කින් වැඩියෙන් දක්වා තිබුණි.	මූල්‍ය නොවන වත්කම් ගිණුම් වාර්තාව හා උපලේඛනය සසඳා නිවැරදිව ගිණුම් පිළියෙල කළ යුතුය.	මෝදර තැපැල් කාර්යාලය දෙවරක් සටහන් වීම නිවැරදි කිරීම සඳහා කටයුතු සිදු කල අතර එම වරද නිවැරදි කල පසු 2024 දෙසැම්බර් 31 දිනට ගොඩනැගිලි වටිනාකම රු. 2,393,558,600 ක් වන බව.
iii.	2024 දෙසැම්බර් 31 දිනට වාහන 181 ක් තක්සේරු කර ඇති අතර එහි රු.80,033,122 කින් වටිනාකම වැඩිවීම සිගාස් වැඩසටහනට ඇතුළත් කර නොතිබුණු අතර එම වාහන 181 න් වාහන 05 ක වටිනාකම සිගාස් වැඩසටහන තුළ ඇතුළත් නොවන අතර වාහන පිළිබඳ ලැයිස්තුවේ සඳහන් කර නොමැති වාහන 02 ක්ද තක්සේරු කර තිබුණි.	තක්සේරු වටිනාකම් වැඩිවීම සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතු අතර වාහන 05 හි වටිනාකමද සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතුය.	2025 මාර්තු 31 දිනට සිගාස් වැඩසටහනට ඇතුළත් කළ බව.
iv.	2023 වර්ෂයේ මිනුවන්ගොඩ තැපැල් කාර්යාල නිල නිවාසය රු. 2,600,000 කටද, උඩුගම්පොළ තැපැල් කාර්යාලය රු. 3,800,000 කටද තක්සේරු කර තිබුණු අතර සිගාස් වැඩසටහනට ඇතුළත් කර නොතිබුණි. උඩුගම්පළ තැපැල් කාර්යාලයේ තක්සේරු වටිනාකම මූල්‍ය නොවන වත්කම් ශේෂය තුළද ඇතුළත් නොවන අතර එය විධිමත්ව පවරාගෙන නොමැති තැපැල් කාර්යාලයක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය.	තක්සේරු වටිනාකම සිගාස් වැඩසටහනට ඇතුළත් කළ යුතු අතර විධිමත්ව පවරාගෙන නොමැති තැපැල් කාර්යාල විධිමත්ව පවරාගෙන තක්සේරු වටිනාකම මූල්‍ය නොවන වත්කම් ශේෂයට ඇතුළත් කළ යුතුය.	පිළිතුරු ලබාදී නොමැත.
v.	දෙපාර්තමේන්තුව විසින් 2024 දෙසැම්බර් 31 දින වන විට තැපැල් කාර්යාල 333 ක්ද, ප්‍රධාන ආයතන 04 ක් පිහිටි ඉඩම්ද විධිමත්ව පවරාගෙන නොතිබුණු අතර	විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු අතර පවරාගෙන ඇති වත්කම් තක්සේරු කර මූල්‍ය	ඉඩම් පවරාගැනීම සඳහා සම්බන්ධ වන ආයතනවල පවතින කාර්යක්ෂමතාවය හා නෛතික තත්ත්වයන් මත පැවරීම් කටයුතු සඳහා යම් කාලයක් ගතවන බව දන්වා ඇති අතර අදාළ ඉඩම් සහ ගොඩනැගිලි තක්සේරු කිරීමේ අදියරේ

පවරාගෙන ඇති නමුත් තක්සේරු කර නොමැති ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණය 15 ක් විය. ප්‍රධාන ආයතන පිහිටි ගොඩනැගිලි 04 ක් හා ඉඩම් 02 ක් පවරාගෙන ඇති නමුත් 2024 දෙසැම්බර් 31 දිනට තක්සේරු කර මූල්‍ය නොවන වත්කම් ලෙස හඳුනාගෙන නොතිබුණි.	ප්‍රකාශනවල දැක්විය යුතුය.	පවතින බවත්, පවරාගෙන නොමැති ඉඩම් කොටස් මැනුම් කර ඇති අතර විධිමත්ව පවරා ගැනීම සඳහා ඉල්ලුම් කර ඇති බවත්, පවරාගෙන ඇති ඉඩම් සහ ගොඩනැගිලි සිගාස් ගිණුම්ගත කර නොමැති අතර එම වත්කම් තක්සේරු කිරීමේ අදියරේ ඇති බව.

3.4 **පාඩු හා හානි**

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	2024 වර්ෂයේ අනුමැතිය ලැබීම මත වර්ෂය තුළ අලාභ අයකර ගැනීම / කපා හැරීම සහ අත්හැරීම් පිළිබඳ ප්‍රකාශයට කපාහැරීම් ලෙස රු. 4,052,263 ක වටිනාකමක් හඳුනාගෙන තිබුණද මූල්‍ය ප්‍රකාශනය තුළ හඳුනාගෙන තිබුණු වටිනාකම රු. 3,423,311 කි. ඒ අනුව රු. 628,952 ක වටිනාකමක් හඳුනාගෙන නොතිබුණි.	හානි හා පාඩු ලෙස කපාහැරීම සඳහා හඳුනාගෙන ඇති වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළද නිවැරදිව හඳුනාගත යුතුය.	අදාළ දත්ත රැස් කරමින් පවතින අතර සියළු දත්ත ලබා ගැනීමෙන් පසු සම්පූර්ණ පිළිතුරක් ඉදිරිපත් කරන බව.
ii.	2024 දෙසැම්බර් 31 දින වන විට වසර 05 ට අඩු රු. 138,570 ක්, වර්ෂ 05 – 10 ත් අතර කාලයට අයත් රු. 542,260 ක් සහ වර්ෂ 10 ට වැඩි රු. 11,937,179 ක ශේෂයක්ද ලෙස එකතු වටිනාකම රු. 12,618,011 ක ශේෂයක් තවදුරටත් අයකර ගැනීමට පැවතුණි.	අයකර ගැනීමට කටයුතු කළ යුතු අතර අය කරගත නොහැකි නම් මු.රෙ. 109 ප්‍රකාරව කටයුතු කළ යුතුය.	මෙම පාඩු හා අලාභ සම්බන්ධව විමර්ශන කටයුතු හා නීතිමය කටයුතු අවසන් වී නොමැති බවත් ලිපිගොනුවල අඩුපාඩු හේතුවෙන් මු.රෙ. 109 ප්‍රකාරව අලාභ කපා හැරීමට නොහැකි බව.

3.5 **කළමනාකරණ දුර්වලතා**

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
i.	තැපැල් කාර්යාල 1,318 කින් 2024 ඔක්තෝබර් 01 දින වන විට ශ්‍රී ලංකා සමාජ ආරක්ෂක මණ්ඩලය මගින් ක්‍රියාත්මක විශ්‍රාම වැටුප් ක්‍රමවලට අදාළ දායකයින් විසින් ගෙවූ රු. 1,417,632 ක මුදල නැවත සමාජ ආරක්ෂක මණ්ඩලයට ගෙවා නොතිබුණි.	අදාළ දායකයින් විසින් ගෙවූ මුදල් සමාජ ආරක්ෂක මණ්ඩලයට යැවිය යුතුය.	රු. 445,519 ක මුදලක් දැනටමත් ගෙවා ඇති බව.

ii.	තැපැල් දෙපාර්තමේන්තුව විසින් 2023 අගෝස්තු 03 දින මිහිකත ආනයන හා අපනයන සමාගම සමඟ එම සමාගමේ භාණ්ඩ තැපැල් දෙපාර්තමේන්තුවේ තැපැල් කුරියර් සේවාව (SL Post Courier & COD) හරහා බෙදා හැරීමට එකඟව අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණි. අවබෝධතා ගිවිසුම් ප්‍රකාරව දේශීය අධිවේගී සේවා ගාස්තු, තැපැල් ගාස්තු ලෙස අය කිරීමට එකඟ වී තිබුණද පාර්සල් 47,510 ක් මෙරට පාර්සල් තැපැල් යටතේ බෙදාහැර තිබුණි. තවද ඒ සඳහා අවශ්‍ය අවබෝධතා ගිවිසුම සංශෝධනය කර අනුමැතියක් වුවද ලබාගෙන නොතිබුණි. මෙරට පාර්සල් සේවාව යටතේ පාර්සලයකට අයකරන ගාස්තුව රු.150ක් වන අතර ඒ අනුව සාමාන්‍ය පාර්සල් සේවාව යටතේ මිහිකත ආනයන හා අපනයන සමාගමෙන් ලද පාර්සල් 47,510 ක් මෙරට පාර්සල් අංශය ඔස්සේ බෙදාහැරීම හේතුවෙන් තැපැල් දෙපාර්තමේන්තුවට රු. 2,375,800 ක අලාභයක් සිදුවී තිබුණි.	අවබෝධතා ගිවිසුමේ කොන්දේසි කඩ කිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශවයන් හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.	මිහිකත ආයතනය භාරදී ඇති පාර්සල් 47,510 ක් සාමාන්‍ය පාර්සල් තැපෑල යටතේ පිටත් කර ඇති බව.